කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2014

2018 අගෝස්තු/සැප්තැම්බර්/ඔක්තෝබර්

සමාජීයවිද්‍යා පීඨය

පුරාවිද්‍යාව

**පුරාවිද්‍යාවේ ඉතිහාසය ARCH E – 1015**

පැරණි නිර්දේශයට අදාළව ප්‍රශ්න පහකට (05) ද නව නිර්දේශයට අදාළව ප්‍රශ්න හතරකට (04) ද පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය (03)

---

1. පුරාවිද්‍යාව යනු කුමක් දැයි හඳුන්වා, විවිධ විද්වතුන් පුරාවිද්‍යාව යන්න විග්‍රහ කර ඇති ආකාරය දක්වා, පුරාවිද්‍යාවේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව විස්තර කරන්න.

2. ලෝක පුරාවිද්‍යා ඉතිහාසය පිළිබඳ කෙටියෙන් හඳුන්වා ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 19 වන සියවසින් පසු පුරාවිද්‍යාවේ ඉතිහාසය පිළිබඳ තොරතුරු දක්වන්න.

3. සෙනරත් පරණවිතානගේ පුරාවිද්‍යා කටයුතුවල දැකිය හැකි එක් ලක්‍ෂණයක් වන්නේ "සෑම විටම අර්ථ නිරූපණය කිරීමට පෙළඹවීමයි" විමසන්න.

4. ප්‍රධාන පුරාවිද්‍යා උරුම භූමියක් ලෙස අනුරාධපුරයේ ඇති පුරාවිද්‍යාත්මක වැදගත්කම විස්තර කරන්න.

5. දියුණු සංස්කෘතියක් හා උසස් තාක්‍ෂණයක් හිමි සමාජයක් වශයෙන් දකුණු ආසියාවේ ප්‍රභවය වූ ශිෂ්ටාචාරය පිළිබඳ පුළුල් විස්තරයක් කරන්න.

6. ලෝකයේ පැරණිතම නාගරික ශිෂ්ටාචාරයෙහි ආර්ථික හා ආගමික තත්ත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්න.

7. පුරා වස්තු යන්න හඳුන්වා, පුරාවිද්‍යා ආඥා පනත මගින් පුරා වස්තුවල ආරක්‍ෂාවට කෙරෙන බලපෑම පිළිබඳ විවේචනාත්මකව විග්‍රහ කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   1. නව පුරාවිද්‍යාව
   11. යුගත්‍රය න්‍යාය
   111. H.C.P බෙල්
   1V. පොළොන්නරුවේ පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක

**********************